# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No
10120

ෆැක්ස්
தொலைநகல
Fax
011-2171635

දුරකථන
தொலைபேசி
Telephone
011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site
www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail
dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1554 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திக / Date: 07/10/2024 පැය 1745

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. වෙඩිතබා මනුෂ්‍ය ඝාතනයකට සම්බන්ධ වෙඩික්කරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත දකුණු දිසාව අපරාධ කොට්ඨාසය.**

2024.09.30 වන දින රාත්‍රී කාලයේ හංවැල්ල පොලිස් වසමේ නෛළුවත්තුඩුව ප්‍රදේශයේදී නාඳුනන තුවක්කුකරුවෙකු විසින් වෙඩි තබා පුද්ගලයෙකු ඝාතනය කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් දකුණ දිසාව අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැඩි දුර විමර්ශණ ආරම්භ කර තිබිණි.

ඒ අනුව මෙම පුද්ගල ඝාතනයට සම්බන්ධව අදාලව වෙඩික්කරු වශයෙන් ක්‍රියා කරන ලද සැකකරු බස්නාහිර පළාත් දකුණු දිසාව අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් 2024.10.07 වන අද දින අළුයම් කාලයේදී බලංගොඩ ප්‍රදේශයේදී අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 38ක් වන වැලිපොත යාය, බලංගොඩ ප්‍රදේශයේ පදිංචි ආරක්ෂක අංශ සාමාජිකයෙකි.**

සැකකරුගෙන් සිදු කරන ලද වැඩිදුර ප්‍රශ්ක කිරීමේදී හංවැල්ල පොලිස් වසමේ දිද්දෙණිය ප්‍රදේශයේ සැකකරුට අයත් නිවසක සඟවා තිබියදී ගිනි අවි සඳහා භාවිතා කරනු ලබන පතොරම් , ජීව අත්බෝම්බයක්, ජංගම දුරකථන 05ක් , යුධ හමුදා නිල ඇඳුමට සමාන ඇඳුමක් ඇතුළු උපකරණ පොලිස් භාරයට ගෙන ඇත.

සැකකරු සමබන්ධව වැඩිදුර විමර්ශනයේදී 2023.12.25 වන දින පාදුක්ක පොලිස් වසමේදී ගිනි අවියකින් වෙඩි තබා පුද්ගලයන් දෙදෙනෙකු ඝාතනය කිරීම සහ 2024.03.04 වන දින හංවැල්ල පොලිස් වසමේදී ගිනි අවියකින් වෙඩි තබා පුද්ගලයකු ඝාතනය කිරීම සහ තවත් පුද්ගලයෙකුට බරපතල තුවාල සිදු

කිරීමේ සිද්දියෙහි වෙඩික්කරු වශයෙන් මෙම සැකකරු ක්‍රියා කර ඇති බවට දැනට සිදු කරන ලද විමර්ෂණ වලදී අනාවරණය වී ඇත.

බස්නාහිර පළාත දකුණ දිසාව අපරාධ කොට්ඨාසය විසින් වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - තිරුක්කෝවිල් පොලිස් ස්ථානය.**

2024.10.07 වන දින උදෑසන කාලයේ තිරුක්කෝවිල් පොලිස් වසමේ කංචිකුඩිච්චාරු වැව ආසන්න ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා තිරුක්කෝවිල් කඳවුරේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන තිරුක්කෝවිල් ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

තිරුක්කෝවිල් පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03.** **මාරක රිය අනතුරක් - මැදිරිගිරිය පොලිස් වසම.**

2024.10.06 වන දින රාත්‍රී කාලයේ මැදිරිගිරිය පොලිස් වසමේ මැදිරිගිරිය දිවුලංකඩවල මාර්ගයේ විහාර මාවත ප්‍රදේශයේදී හිගුරක්ගොඩ දෙස සිට මැදිරිගිරිය දෙසට ධාවනය වූ යතුරුපැදියක් ඊට ප්‍රතිවිරුද්ධ දෙසින් පැමිණි යතුරුපැදියක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ එක් යතුරුපැදියක පැදිකරු මැදිරිගිරිය රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 24 ක් වූ දිවුලංකඩවල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මැදිරිගිරිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර මැදිරිගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04.** **මාරක රිය අනතුරක් - කොස්ගොඩ පොලිස් වසම.**

2024.10.07 වන දින අළුයම් කාලයේ කොස්ගොඩ පොලිස් වසමේ ගාල්ල කොළඹ ප්‍රධාන මාර්ගයේ ඉදුරුව ප්‍රදේශයේදී කොළඹ දෙස සිට ගාල්ල දෙසට ධාවනය වූ ලොරි රථයක් මාර්ගය හරහා ගමන් ගන්නා ලද පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා බලපිටිය රෝහලේ දැඩි සත්කාර ඒකකයේ ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත.

**මරණකරුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත.**

අනතුර සම්බන්ධයෙන් ලොරි රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මෘත ශරීරය බලපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත කොස්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05.** **මාරක රිය අනතුරක් - කුරුවිට පොලිස් වසම.**

2024.10.07 වන දින උදෑසන කාලයේ කුරුවිට පොලිස් වසමේ කුරුවිට එරත්න මාර්ගයේ සූදගල, මිල්ලඇල පාලම අසල ප්‍රදේශයේදී එරත්න දෙස සිට කුරුවිට දෙසට දෙසට ධාවනය වූ ත්‍රීරෝද රථය ඉදිරියෙන් කුරුවිට දෙස සිට එරත්න දෙසට ධාවනය වූ වෑන් රථය මිල්ලඇල පටු පාලම මතින් ධාවනය වන අවස්ථාවේදීම ත්‍රීරෝද රථයත් එම පාලම දෙසට ධාවනය කර ඇත. එහිදී ත්‍රීරෝද රථය ලිස්සා ගොස් වෑන් රථයේ බඳ කොටසේ ගැටීමෙන් අනතුරක් සිදුව ඇත. අනතුරින් ත්‍රීරෝද රථයේ රියදුරු සහ පිටුපස ගමන් ගත් කාන්තාවක් බරපතල තුවාල ලබා  රත්නපුර රෝහලට ඇතුලත් කරන අවස්ථාවේදී කාන්තාව මිය ගොස ඇත.

**මරණකාරිය වයස අවුරුදු 70 ක් වන දැරණියගල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

අනතුර සම්බන්ධයෙන් ත්‍රීරෝද රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇති අතර මෘත ශරීරය රත්නපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. කුරුවිට පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**